## ශ්‍රී ලංකා තුල මොන්ට්‍රියල් සන්ධානයේ ධිවිධාන ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාව ඕසොන් විය සුරුකීම සඳහා වූ වියනා සම්මුතියේ සහ ඕසෝන් ක්ෂයකාරක පාලනය සඳහා වූ මොන්ට්‍රියල් සන්ධානයේ ක්‍රියාකාරී පාර්ශවකරුවෙකු ලෙස 1989 වසරේ සිට ක්‍රියාකරන අතර ඕසෝන් ක්ෂයකාරී රසායන ද්‍රව්‍ය භාවිතයෙන් ඉවත් කිරීම සඳහා වන ගෝලීය ප්‍රයත්නයට සුවිශේෂී දායකත්වයක් ලබා දීම සඳහා ජාතික කේන්ද්‍රීය ලක්ෂ්‍යය ලෙස පරිසර අමාත්‍යාංශයේ ජාතික ඕසෝන් ඒකකය ක්‍රියා කරනු ලැබේ. ඒ අනුව, 2030 ජනවාරි 01 වැනිදා සිට හයිඩ්‍රොක්ලෝරොෆ්ලෝරොකාබන් (HCFCs) ශ්‍රේණියට අයත් රසායන ද්‍රව්‍ය ආනයනය හෝ අපනයනය සම්පූර්ණයෙන්ම තහනම් කරනු ලබයි.

ශ්‍රී ලංකාව 2016 වර්ෂයේදී මොන්ට්‍රියල් සන්ධානයට සිදු කල එක් සංශෝධනයක් වන කිගාලි සංශෝධනය සඳහා ද අනුගත වී ඇති අතර ගෝලීය උනුසුම ඉහළ යාමට දායකත්වයක් දක්වනු ලබන හයිඩ්‍රොෆ්ලෝරෝකාබන් (HFCs) ශ්‍රේණියට අයත් රසායනික ද්‍රව්‍ය භාවිතය පාලනය කිරීම මෙන්ම ඉන්පසුව අවම කිරීම සඳහා එකඟතාවය පල කර ඇත. ඒ අනුව (HFCs) ආනයනය කිරීම පාලනය කිරීම සඳහා 2024 වර්ෂයේ සිට කෝටා නිකුත් කිරීම හා බලපත්‍ර ලබාදීම සිදු කරනු ලැබේ.

තවද ඉහත රසායන ද්‍රව්‍යයන් භාවිතයෙන් ඉවත් කිරීම, අවම කිරීම හා භාවිතය පාලනය කිරීම මගින් වායු සමන හා ශිතකරණ ක්ෂේත්‍රයට මලින් පරිසර සිදු වන හානි වළක්වා ගැනීම සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයන් හා පරිසර හිතකාමී ශීතකාරකයන් මෙම ක්ෂේත්‍රයට හඳුන්වාදීම ද ක්‍රමානුකූලව සිදු කරනු ලබයි. ඒ අනුව, දේශීය ශීතකරණ හා වායු සමීකරණ (Ref/Ac) කර්මාන්තයේ තිරසාර බව සහතික වන ලෙස ඕසෝන් ප්‍රහීනකාරී රසායනික ද්‍රව්‍ය (ODS) භාවිතයෙන් ඉවත් කිරීම සහ ඉහළ ගෝලීය උණුසුම් විභවයක් සහිත (GWP) ශීතකාරක (රසායන ද්‍රව්‍ය) භාවිතය අවම කිරීම සඳහා දායකත්වය ලබාදීම ප්‍රධාන අරමුණ වේ.

ඕසෝන් ස්ථරය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ සහ ගෝලීය උණුසුම අවම කිරීමේ ප්‍රයත්නයට දායකත්වය දැක්වීම සඳහා 2021 වර්ෂයේදී ජාතික ඕසෝන් ඒකකය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන් මෙසේය..

ශ්‍රී ලංකාව තුල මොන්ට්‍රියල් සන්ධානයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම පිණිස ස්ථාපිත ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව 2021 වර්ෂයේ මැයි 28 දින රැස්වූ අතර මොන්ට්‍රියල් සන්ධානයෙහි ඉලක්ක සපුරා ගැනීම සඳහා අදාල වන ප්‍රතිපත්ති බලාත්මක කිරීමේ තීරණ රැසකට එහිදී එළඹෙන ලදී.

**HCFC ආනයන පංගු ක්‍රමවේදය (quota distribution) යටතේ 2021 වර්ෂය සඳහා කෝටා නිකුත් කිරීම (ඕසෝන් ප්‍රහීනකාරක රසායනික ද්‍රව්‍ය පාලනය සඳහා ක්‍රියාත්මක යාන්ත්‍රණය) සාර්ථකව නිම කර ඇති අතර සුදුසුකම්ලත් ආයතන 16ක් සඳහා මෙට්‍රික් ටොන් 156.059 ත් ජාතික ඕසෝන් ඒකකයේ නිර්දේශය මත නිකුත් කරන ලද ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලන බලපත්‍රයක් සහිතව ආනයනය කරන ලදී.**

මොන්ට්‍රියල් සන්ධානයේ 7 වන වගන්ති යටතේ “වාර්ෂික ඕසෝන් ප්‍රහීනකාරී රසායනික ද්‍රව්‍ය (ODS) හා එම රසායන ද්‍රව්‍යයන් සඳහා වූ විකල්පයන් රසායන ද්‍රව්‍යයන්ගේ පරිභෝජන දත්ත ඕසෝන් ලේකම් කාර්යාලයට හා බහු පාර්ශ්වීය අරමුදලට වාර්තා කිරීම අනිවාර්ය කාර්යයක් වන අතර ඒ අනුව 2020 වසරේ ඕසෝන් ප්‍රහීනකාරී රසායනික ද්‍රව්‍ය (ODS) මෙන්ම විකල්ප රසායන ද්‍රව්‍යයන් පිළිබඳව පරිභෝජනය දත්ත 2021 සැප්තැම්බර් 23 වැනි දින අදාළ ආයතන වෙත වාර්තා කරන ලදී.

ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ නියුතු පිළිගත් සහතිකයක් සහ විධිමත් පුහුණුවක් නොමැති කාර්මික ශිල්පීන්ගේ සේවය ප්‍රමිතිකරණයට ලක් කර නිසි පුහුණුවක් ලබා දීමෙන් පසු “පෙරදැනුම පාදක ඇගයීම (RPL)” ක්‍රමය පදනම් කර ගෙන NVQ සහතිකයක් පිරිනැමීම ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සමග එක්ව ජාතික ඕසෝන් ඒකකය මගින් ආරම්භ කර ඇත. මේ යටතේ 2021 වර්ෂය තුල කාර්මික ශිල්පීන් 36 දෙනෙකු සඳහා RPL සහතිකපත් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. තවද, මේ පිළිබඳව ශ්‍රී ලංකාව පුරා විසිර සිටින වායු සමන හා ශීතකරණ ක්ෂේත්‍රයේ විධිමත් පුහුණුවක්

නොමැති කාර්මික ශිල්පීන් මෙම වැඩසටහන සඳහා යොමු කර ගැනීමේ අරමුණ ඇතිව භාෂා ත්‍රිත්වයෙන්ම සකස් කරන ලද දැන්වීමක් සමාජ මාධ්‍ය පුවත් පත් හා වෙබ් අඩවි තුල පළ කර පුළුල් ප්‍රචාරණයක් ලබා දුන් අතර ඒ සඳහා ඉහළ ප්‍රතිචාරයක්ද ජාතික ඕසෝන් ඒකකය වෙත ලැබී ඇත.

ඕසෝන් ප්‍රහීනකාරී හා ගෝලීය උණුසුම ඉහළ යාමට දායකත්වයක් දක්වනු ලබන ශීතකාරක භාවිතය වායු සමන හා ශීතකරන ක්ෂේත්‍රයෙන් ක්‍රමානුකූලව ඉවත් වීමත් සමඟ විකල්ප ශිතකාරකයන් ගෝලීයව භාවිතය ආරම්භ කරන ලදී. එබැවින් එසේ භාවිතා කරනු ලබන ශීතකාරකයන් ගිනි ගන්නා සුළු හා විෂ සහිත වන අතර ඒවා භාවිතය සඳහා ජාත්‍යාන්තර ප්‍රමිති හඳුන්වා දී ඇති අතර ඒ අනුව ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) හඳුන්වාදීම අත්‍යවශ්‍ය කාර්යයකි. එබැවින් මෙම ප්‍රමිතීන් පිළිබඳව සමාලෝචනය කිරීම හා ඒ සඳහා නිසි මාර්ගෝපදේශකත්වය ලබා දීම සඳහා තාක්ෂණික කමිටුවක් පත් කරන ලද අතර කමිටු වාර 02ක් රැස් වී මෙම ප්‍රමිතිකරණ ක්‍රියාවලියේ මූලික කටයුතු ආරම්භ කරන ලදී.

**ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ පුහුණුවන්නන්ගේ ධාරිතා වර්ධනය කිරීම පිණිස ශීතකාරක හා ඊට අදාල උපකරණ හා යන්ත්‍ර නිවැරදි ලෙස භාවිතය සඳහා** මොණරාගල, මිරිජ්ජවිල, හේනකඩුව, පැල්පොත, කිළිනොච්චිය යන වෘත්තීය පුහුණු ආයතන සඳහාත් බෙලිඅත්ත හා කිළිනොච්චිය

ශීතකාරකයන් කෘෂිකාර්මික, රෝහල්, කාර්මික හා වාණිජ , ධීවර , පශු සම්පත් , සංචාරක, ඖෂධ, ආහාර සැකසීම, ප්‍රවාහන, ශීත ගබඩා යන සියළු අංශයන්හී සිසිලන කටයුතු සඳහා යොදා ගනු ලබන බැවින් මේවා භාවිතයෙන් ඉවත් කිරීම තුලින් ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයට විශාල බලපෑමක් ඇති වනු වැලැක්වීම හා බලශක්ති කාර්යක්ෂමතාව ඉහල නංවමින් විවිධ ක්ෂේත්‍රයන්හි ශීතන දාමය නිසියාකාරව පවත්වා ගැනීම සහතික කිරීම පිණිස ශ්‍රී ලංකාව සඳහා ජාතික සිසිලන ප්‍රතිපත්තියක් සකස් කරන ලදී.
ශ්‍රී ලංකාව සඳහා "ජාතික සිසිලන ක්‍රියාකාරී සැලැස්ම " යනු සිසිලන ක්ෂේත්‍රයට අදාල සියළුම අංශ සම්බන්ධ කරමින් ශ්‍රී ලංකාවේ සිසිලන බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට උපයෝගී කර ගත හැකි උපායමාර්ගික සැලැස්මක් වන අතර එම වාර්තාව සකසා අවසන් කර ඇත.

**පවතින වායු සමන යන්ත්‍ර ප්‍රතිස්ථාපනය / ආදේශ කිරීමේදී එම යන්ත්‍ර නැවත මිලදී ගැනීමේදී පරිසර හිතකාමී වායු සමන යන්ත්‍ර මිලදී ගැනීම වෙනුවෙන් දිරි දීමනා යන්ත්‍ර 46ක් මිලදී ගැනීම වෙනුවෙන් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා ලබා දෙන ලදී.**

**2021 සැප්තැම්බර් 16 වන දින ,අපව, අපගේ ආහාර සහ එන්නත් සිසිල්ව තබයි තේමාව පෙරදැරි කරගෙන ගරු පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ හා ලේකම්, වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ හා අදාල පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් සූම් තාක්ෂණය ඔස්සේ පැවැත්විණි. මෙයට සමගාමීව ගෝලීය උණුසුම් වීමේ බලපෑම අවම කිරීම සඳහා බීජ බෝල** ව්‍යාප්ත කිරීම සඳහා "Throw & Grow" සංකල්පය හඳුන්වා දෙන ලදී. මෙම බීජ බෝල 100,000 ක් බෙදා හැරීම තුලින් කාබන් උදාසීන කිරීම සඳහා ශ්‍රී ලංකාව ගන්නා වූ උත්සාහයට දායක වීමට තීරණය කර තිබේ.

ඕසෝන් ස්තරය ආරක්ෂා කිරීම පිළිබඳ දැනුම හා දැනුවත්භාවය බෙදා හැරීමේ තිරසාරභාවය සහතික කිරීම සඳහා ජාතික ඕසෝන් ඒකකය, මධ්‍යම පරිසර අධිකාරිය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින් උනන්දුවක් දක්වන පරිසර නිලධාරීන් 24ක් ඕසෝන් පුහුණුකරුවන් ලෙස සංවර්ධනය කරන ලදී.
ශිතකරණ හා වායු සමන ක්ෂෙත්‍රයේ සේවා හා නඩත්තු කටයුතුවලදී ශීතකාරක ක්‍රමවත් ලෙස භාවිතය, උපකරණ හා යන්ත්‍ර නිසි පරිදි හැසිරවීම හා නව තාක්ෂණ හා ප්‍රවණතාවයන් පිළිබඳව ක්‍රමවේදයන් සම්බන්ධව වැඩමුළු ශීතකරණ හා වායු සමන ක්ෂේත්‍රයේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතනවල පුහුණුවන්නන්, පුහුණුකරුවන් හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු කාර්මිකයින් සඳහා පවත්වන ලදී.